රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2014 (VIII)

මගේ අංකය : EST-2/05/POL/0059
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.10.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ නොකළ නිලධරයන්ට එම අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට හා භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ නොකිරීම නිසා උසස්වීම් නොලද නිලධරයන්ට එම උසස්වීම් ලබාදීම සඳහා පහත විධිවිධාන ක්‍රියාත්මක කිරීමට 2019.08.27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

(අ) ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014(IV)හි 03 වන ඡේදයේ විධිවිධාන පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

" 2007.07.01 දිනට පෙර රාජ්‍ය සේවයට ඇතුළත්ව සීමිත හෝ කුසලතා පදනම මත උසස්වීම් ලබා 2019.01.01 දිනට වයස අවුරුදු 50 සම්පූර්ණ කර ඇති හෝ 2007.07.01 දිනට පෙර රාජ්‍ය සේවයට ඇතුළත්ව සීමිත හෝ කුසලතා පදනම මත උසස්වීම් ලබා ගන්නා අවස්ථාවේ දී වයස අවුරුදු 50 සම්පූර්ණ කර ඇති හෝ නිලධරයන් තමන් නව පත්වීම් ලැබූ ඉහළ තනතුරට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත සකස් කරනු ලැබූ විෂය නිර්දේශ අනුව පවත්වනු ලබන පැය 100ක පුහුණු පාඨමාලාවක් සඳහා සහභාගීත්වය පමණක් ප්‍රමාණවත් වේ."

(ආ) එසේම රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම උසස් වීම් සඳහා අවශ්‍යතාවක් ලෙස බඳවා ගැනීම් පරිපාටිවල හා සේවා ව්‍යවස්ථාවල සඳහන්ව තිබීම නිසා මෙතෙක් ශ්‍රේණි උසස්වීම ලබා ගත නොහැකි වූ නිලධරයන්ට රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම හැර අනිකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් එම ශ්‍රේණි උසස්වීම් ලබා දීමට කටයුතු කර උසස්වීමට අදාළ වැටුප් පරිවර්තනය කිරීමෙන් පසු ඉන් ඔබ්බට වන වැටුප් වර්ධක අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කරන තෙක් නතර කිරීමට කටයුතු කළ යුතුය.

03. මෙම චක්‍රලේඛ විධිවිධාන 2019.08.27 දින සිට බලාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය